# පුස්තකාලය
# ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

Past Examination Papers ලබා ගැනීම සඳහා වන මාර්ගෝපදේශය

මෙම මාර්ගෝපදේශය මඟින් පුස්තකාල Repository පද්ධතිය තුළ පරිශීලක ගිණුමක් (User Account) සාදාගැනීම සහ පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර (Past Examination Papers) සඳහා අවශ්‍ය අවසරය (Access) ලබා ගන්නා ආකාරය පියවරෙන් පියවර පැහැදිලි කරයි.

### පියවර 01: Repository වෙබ් අඩවියට පිවිසීම

- මුලින්ම පුස්තකාලයේ නිල Repository වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.
- එහි මුල් පිටුවේ ඉහළ දකුණු කෙළවරේ (Top Right Corner) දක්වා ඇති 'Log In' බොත්තම ක්ලික් කරන්න.

### පියවර 02: නව පරිශීලක ලියාපදිංචිය

- පිවිසුම් පිටුව (Login page) පෙන්වන මෙනුවෙන් 'New user? Click here to register.' යන සබැඳිය (Link) තෝරා ක්ලික් කරන්න.

### පියවර 03: ඊමේල් ලිපිනය ලබා දීම

- විවෘත වන නව ලියාපදිංචි කිරීමේ පිටුවේ ඔබගේ නිල / භාවිත කරන Email Address (විද්‍යුත් තැපැල් ලිපිනය) ඇතුළත් කරන්න.
- ඉන්පසු 'Register' බොත්තම ක්ලික් කරන්න.

### පියවර 04: ඊමේල් සබැඳිය හරහා විස්තර සැපයීම

- ඔබ ඇතුළත් කළ ඊමේල් ලිපිනයට ලැබෙන තහවුරු කිරීමේ ලින්ක් (Verification link) එක ක්ලික් කරන්න.
- එහිදී ඔබේ නම, මුරපදය (Password) ඇතුළු අවශ්‍ය අනෙකුත් පරිශීලක විස්තර (User details) නිවැරදිව ලබා දී ගිණුම සම්පූර්ණ කරගන්න.

### පියවර 05: පුස්තකාල කවුන්ටරය දැනුවත් කිරීම

- ඔබගේ ගිණුම සාර්ථකව සාදා අවසන් වූ පසු, පුස්තකාල කවුන්ටරයට (Library Counter) දැනුම් දී Past Papers බැලීම සඳහා අවශ්‍ය අවසරය (Access) ඉල්ලා සක්‍රීය කරගන්න.